# ආගමන සමයේ නුවාතය
# දෙසැම්බර් 20

**පළමුවන කියවීම** යෙසායා 7: 10–14

යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

*කන්‍යාවක් පිළිසිඳගෙන පුතකු බිහි කරන්නී ය.*

සමිඳාණන් වහන්සේ ආහාස්ට තවත් පණිවුඩයක් යවමින්, "නුඹට ලකුණක් දෙන ලෙස නුඹේ දෙවි සමිඳාණන් වහන්සේගෙන් ඉල්ලන්න. ගැඹුරු පාතාලයෙන් හෝ ඉහළ අහසෙන් හෝ එය පැමිණෙන ලෙස ඉල්ලන්නැ" යි වදාළ සේක.

එහෙත් ආහාස් උත්තර දෙමින්, "මම නොඉල්ලමි. සමිඳාණන් වහන්සේ පරීක්ෂා නොකරමි" යි කිය. එයට ඉසයියස් මෙසේ පිළිතුරු දුන්නේ ය. "එම්බා දාවිත්ගේ වංශය, දැන් සවන් දෙන්න. නුඹලා මාගේ දෙවියන් වහන්සේගේ ඉවසීම වෙහෙසන්නේ, නුඹලා මනුෂ්‍යයන්ගේ ඉවසීම වෙහෙසනවා මදිවාට ද? සමිඳාණන් වහන්සේ ම නුඹලාට ලකුණක් දෙන සේක. බලන්න, කන්‍යාවක් පිළිසිඳ ගෙන පුත්‍රයෙකු බිහි කරන්නී ය. එම්මානුවෙල් යන නම ඔහුට තබන්නී ය. ("මන්ද, සමිඳාණන් වහන්සේ අප සමග ය".)

*දේව වචනය මෙසේ ය.*

| පිළිතුරු ගීය | ගීතාවලිය 24: 1–6 |
|---|---|

පිළිතුර: ප්‍රතාපවත් මහ නිරිඳාණෝ වඩින සේක.
එතුමාණන්ට වාසල් දොරටු විවෘත කරන්න.

ගීය: පොළොව හා එහි ඇති සැම දෙය ද සකල ලෝක වාසීහු ද
සමිඳුන් සන්තක වෙති.
මුහුදු ජලය පිට පොළොව පිහිටුවා සයුරු පත්ලෙහි
එය ස්ථාපිත කළේ එතුමාණෝ ය.

හිමි තුමන්ගේ කන්දට නගින්නට සුදුසු කවුරු ද?
එතුමන්ගේ සුද්ද දෙව් මැඳුරෙහි නවතින්නට හැකි කාට ද?
ක්‍රියාවෙන් පිරිසුදු, සිතින් නිර්මල, නිෂ්ඵල දෙයට වැඳුම් පිදුම් නොකරන,
බොරුවට නොදිව්රන තැනැත්තාට ය.

එවැනි අයට සමිඳාණෝ ආසිරි දෙති.
මිදුම්කාර දෙවිඳාණෝ මොක් සුව දෙති.
දෙවිඳුන් සොයා යන්නෝ ද
ජාකොබ් ගේ දෙවිඳුන්ගේ සරණ පතා යන්නෝ ද එවැනි අය ය.

## සුපුවත් ජය නද

ආලේලූයා! ආලේලූයා!
සදාකාලික රාජ්‍යයේ දොරටුව විවෘත කරන,
දාවිත්ගේ යතුර වූ තැනැත් වහන්ස,
අඳුරෙහි වසන සිරකරුවන් මිදීමට වැඩම කළ මැනව.
ආලේලූයා!

සුවිශේෂක ලූක් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය මෙසේ ය.

*"ඔබ ගැබ්දරා පුතකු ලබන්නෙහි ය".*

සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝසෙප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදී. ඒ කන්‍යාවගේ නම මරියා ය. දේව දූතයා ඇ සිටි තැනට පැමිණ, "විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ. ස්වාමින් වහන්සේ ඔබ සමග ය" යි කීය. එහෙත් ඇ ඒ වදන් අසා අතිශයින් කැළඹී "මේ කෙබඳු ආචාරයක් දැ" යි සිත සිතා සිටියා ය. දේව දූතයා ඇට කතා කොට, "මරියාණනි, බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගෙන් ආශිර්වාද ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය. උන් වහන්සේට 'ජේසුස්' යන නාමය තබන්න. උන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. 'පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ ය' යි කියනු ලබන සේක. උන් වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි සවාමින් වහන්සේ උන් වහන්සේට ප්‍රදානය කරන සේක. උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක. උන් වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේය" යි කීය.

එවිට මරිය තුමී දේව දූතයාට කතා කොට, "මට පුරුෂයෙකු නැති බැවින් මෙවැන්නක කෙසේ විය හැකි දැ" යි ඇසුවා ය. දේව දූතයා ඇට උත්තර දෙමින්, "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරේ පහළ වන සේක. පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසා ගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා 'දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය' යි කියනු ලබන සේක. බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතෙකු පිළිසිඳ ගත්තා ය. වඳ යයි කී ඇයට දැන් සවැනි මාසය ය. මක්නිසා ද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ" යි කීවේ ය. මරිය තුමී කතා කරමින්, "බලන්න, මම ස්වාමින් වහන්සේගේ දාසිය වෙමි. ඔබ පැවසූ ලෙසම මට ඉටු වේවා" යි කීවා ය. එවිට දේව දූතයා ඇ කෙරෙන් වෙන්ව ගියේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*